දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ (අයි-මාර්ග-II) - 2022
---------------------------------------------------------------------------------

දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ (අයි-මාර්ග-II) 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2017 නොවැම්බර් 22 දින එළැඹි අංක 3579 එස්ආර්අයි සහ අංක 3580 එස්ආර්අයි (සීඕඑල්) ණය ගිවිසුම්, 2019 නොවැම්බර් 13 දින එළැඹි අංක 3851 එස්ආර්අයි ණය ගිවිසුම, 2021 මැයි 28 දින එළැඹි අංක 4067 එස්ආර්අයි යන ණය ගිවිසුම්වල IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් සහ වැඩසටහනේ කාලය**

වැඩසටහනේ ණය ගිවිසුම්වලට අනුව, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ ප්‍රවාහන සහ මහාමාර්ග අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණ වන්නේ, ග්‍රාමීය ප්‍රජාව සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර මාර්ග ප්‍රවේශතාවය වැඩිදියුණු කිරීමය. මෙහි දිගුකාලීන බලපෑම වන්නේ ජාතික හා පළාත් මාර්ගවල ප්‍රවාහන කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම වේ. ණය ගිවිසුම්වලට අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 165,185 කට සමාන එ.ජ.ඩො. මිලියන 1,084.60 ක් වන අතර ඉන් රු. මිලියන 137,070 කට සමාන එ.ජ.ඩො. මිලියන 900 ක් මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි. ඉතිරි මුදල රු. මිලියන 28,115 කට සමාන එ.ජ.ඩො. මිලියන 184.6 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂිතය. වැඩසටහනේ මූල්‍ය සැලසුම බහු අදියර මූල්‍ය පහසුකම යටතේ අදියර පහකින් සමන්විත අතර 2022 දෙසැම්බර් 31 දින වන විට එ.ජ.ඩො. මිලියන 500 ක් වූ පළමු අදියර තුනෙහි ගිවිසුම් ණය ප්‍රදානකරු සමඟ අත්සන් කර තිබුණි. වැඩසටහන එහි කටයුතු 2018 ජූලි 20 දින ආරම්භ කරන ලද අතර 2027 මාර්තු 31 දින වන විට නිමකිරීමට නියමිතය.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

මාගේ වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස වැඩසටහනේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **2022** දෙසැම්බර් **31** දිනට රු. මිලියන **18,569.76** ක් වූ වැඩ අවසන් කළ මාර්ග පැකේජ **09** ක පිරිවැය වැඩසටහන විසින් ප්‍රාග්ධනීකරණය කර තිබුණද, එම පැකේජ **09** න් පැකේජ **08** ක අදාළ කොන්ත්‍රාත්කරුවන්ට රු. මිලියන **129.77** ක මුදලක් තවදුරටත් ගෙවිය යුතුය. එබැවින් නිම කරන ලද මාර්ගවල | **129.77** | අදාළ ගිණුම්වල සටහන් යෙදීමට කටයුතු කරනු ලැබේ. | වැඩ අවසන් කරන ලද මාර්ගවල පිරිවැය ප්‍රාග්ධනීකරණය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | පිරිවැය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | | | |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය අංක 8 ට පටහැනිව, කොන්ත්‍රාත් අවලංගු කරන ලද කොන්ත්‍රාත්කරුවන්ගෙන් රු. මිලියන 1,250.88 ක් වූ වැඩ අරම්භකිරීමේ අත්තිකාරම් සහ කාර්ය සාධන ඇපකර මත අවිනිශ්චිත අයවීම් සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සපයා නොතිබුණි. තවද, එම අයකර ගැනීම්වලට එරෙහිව කොන්ත්‍රාත්කරුවන් අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇති බවද අනාවරණය විය. | 1,251 | ඇප මුදල් අය කිරීම වළක්වමින් කොන්ත්‍රාත්කරුවන් විසින් අධිකරණ නියෝග ලබාගෙන තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | අයි මාර්ග සහ අයි මාර්ග 2 හි වැඩසටහන් කළමනාකරණ ඒකකයේ සමාලෝචිත වර්ෂය සඳහා සම්පූර්ණ ගොඩනැගිලි කුලිය වූ රු. මිලියන 18.32 ක් එක් එක් ඒකකයට සමානුපාතිකව බෙදා නොගෙන අයි මාර්ග වැඩසටහනට අය කර තිබුණි. | 18.32 | ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, එහි වියදම් අයි මර්ග II වැඩසටහනට බෙදා වෙන් කළ නොහැක. | වියදම් සාධාරණ ලෙස වැඩසටහන් අතර බෙදා වෙන්කළ යුතුය. |

## 2.2 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| අංකය | නීති,රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසි 14.6 උප වගන්තිය | කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ යුතු අතුරු ගෙවීම් සහතිකයේ අවම වටිනාකම පිළිගත් කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 1.5 කි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ පැකේජ 58 ක් යටතේ නියමිත සීමාවට වඩා අඩු රු. මිලියන 5,192.39 ක් වූ අතුරු ගෙවීම් සහතික 326 ක් කොන්ත්‍රාත්කරුන්ට ගෙවා තිබුණි. | රටේ පවතින දුෂ්කර තත්ත්වයන් සැලකිල්ලට ගනිමින්, ගෙවීම් වටිනාකම් සීමාවට වඩා අඩු වුවද මාසික ගෙවීම් සහතික සැකසීමට උපදේශක (ඉංජිනේරු) වෙත උපදෙස් ලබා දී ඇත. | කොන්ත්‍රාත් කොන්දේසිවල දක්වා ඇති සීමාවන් පිළිපැදිය යුතුය. |
| (ආ) | කොන්ත්‍රාත් පොදු කොන්දේසි 14.7 සහ 14.8 උප වගන්ති | සේවා යෝජකයා විසින් එක් එක් අතුරු ගෙවීම් සහතිකවල සහතික කළ අගය දින 56 ක් ඇතුළත ගෙවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ | කොන්ත්‍රාත්කරුවන් ඉදිරිපත් කරන ලේඛනවල යම් යම් විෂමතා සහ අසම්පූර්ණ භාවයන් තිබිය හැක. මෙම නිසා දින 56 | කොන්ත්‍රාත් කොන්දේසි පිළිපැදිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | රු. මිලියන 2,102.71 ක් වූ අතුරු ගෙවීම් 90 ක දින 01 සිට 90 දක්වා වූ ප්‍රමාදයන් නිරීක්ෂණය විය. ප්‍රමාද කාල සීමාව තුළ නොගෙවූ මුදල මත මූල්‍ය ගාස්තු ලබාගැනීමට කොන්ත්‍රාත්කරුට හිමිකම් ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | කට වැඩි ප්‍රමාදයක් ඇති විය හැක. | |
| (ඇ) | කොන්ත්‍රාත් පොදු කොන්දේසි 4.2 උප වගන්තිය | කොන්ත්‍රාත් පොදු කොන්දේසි 4.2 උප වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්කරුවන් විසින් කාර්ය සාධන සුරක්ෂණ ඔවුන්ගේ වියදමින් ලබා දිය යුතු වුවද, කොන්ත්‍රාත්කරුවන්ට හිමිකම් පෑමට හැකි වන පරිදි මූලික සහ පොදු අයිතම යටතේ වෙනම ගෙවීම් අයිතමයක් ප්‍රමාණ පත්‍රවල සකස් කර ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව 2022 දෙසැම්බර් 31 දිනට කාර්ය සාධන සුරක්ෂණ වල පිරිවැය ප්‍රතිපූරණය කිරීම සඳහා ඌව පළාතේ කොන්ත්‍රාත්කරුවන්ට රු. මිලියන 85.64 ක මුදලක් ගෙවා තිබුණි. | ප්‍රතිපාදන ලබා නොදුන්නේ නම් ඇපකරයේ පිරිවැය සහ අනෙකුත් පොදු වියදම් ප්‍රමාණ පත්‍ර අයිතම යටතේ ඇතුළත් කළ හැකිව තිබුණි. | කොන්ත්‍රාත් කොන්දේසි පිළිපැදිය යුතුය. |
| (ඇ) | 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනත. | රු. මිලියන 5 ට වැඩි වටිනාකමක් ඇති පොදු කොන්ත්‍රාත්වල ලංසුකරුවන් ලංසු තැබීමේ ලියකියවිලි ලබාගැනීමට පෙර පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි විය යුතු අතර කොන්ත්‍රාත්තුව පිරිනැමීමෙන් පසු කොන්ත්‍රාත් ලියාපදිංචිය ලබා ගත යුතුය. අදාළ ලංසුකරුවන්ගේ තාක්ෂණික ලංසු ඇගයීමේදී එම අවශ්‍යතාව ව්‍යාපෘතිය විසින් සලකා නොතිබුණු බව නිරීක්ෂණය විය. | ආ.සං.බැ. සාමාජික රටවල ලියාපදිංචි වී ඇති සහ ආ.සං.බැ. විසින් අසාදු ලේඛනගත කර නොමැති කොන්ත්‍රාත් සමාගම් වලින් ආ.සං.බැ. අවශ්‍යතා අනුව කොන්ත්‍රාත්කරුවන් තෝරාගෙන ඇත. | ලංසුකරුවන් සහ ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තුව පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි කළ යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල භෞතික ප්‍රගතිය

| සංරචකය | කාර්යය | 2022 දෙසැම්බර් 31 දිනට | ප්‍රමාදය/විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|

| | | අපේක්ෂිත භෞතික කාර්ය සාධනය (%) | අත්කරගත් කාර්ය සාධනය (%) | | |
|---|---|---|---|---|---|
| ජාතික හා ග්‍රාමීය මාර්ග පුණරුත්ථාපන කටයුතු අවසන් කිරීම | ජාතික හා ග්‍රාමීය මාර්ග | 89.35 | 66.95 | (අ) පහසුකම් පරිපාලන අත්පොතට අනුව ජාතික මාර්ග කි.මී. 417.75 ක් සහ ග්‍රාමීය මාර්ග 1349 ක කි.මී. 3338.87 ක් ප්‍රතිසංස්කරණය කිරීමට අපේක්ෂා කළද, ජාතික මාර්ග 13 ක කි.මී. 153.74 ක් සහ ග්‍රාමීය මාර්ග 557 ක කි.මී. 1,432.42 ක් පමණක් ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර අදාළ ආයතන වෙත භාරදී තිබුණි.<br><br>(ආ) වැඩසටහනේ ඌව, උතුරු සහ නැගෙනහිර පළාත්වල ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතුවල දින 720 ක් වූ මූලික කොන්ත්‍රාත් කාලය දින 444 සිට දින 530 දක්වා වූ කාලයකින් ඉක්මවා තිබුණි. | දුර්වල කොන්ත්‍රාත් කළමනාකරණය, ඉන්ධන සීමා කිරීම සහ අමුද්‍රව්‍ය හිඟය. |

| | |
|---|---|
| කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | 2022 අවසාන කාර්තුවේදී ප්‍රකාශයට පත් කරන ලද සිවිල් වැඩ තාවකාලිකව අත්හිටුවීම, නිම කිරීමේ ප්‍රතිශතය මෙම මට්ටමට සීමා කර තිබුණි. |
| විගණකගේ නිර්දේශය | අමතර පිරිවැය වළක්වා ගැනීම සඳහා කාල රාමුව තුළ වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට උපරිම උත්සාහයක් ගත යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | **කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම (EOT)** | | |
| (අ) | පළාත් 04 තුල අවලංගු කරන ලද පැකේජ 03 ද ඇතුළුව ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වූ පැකේජ 53 කින් පැකේජ 46 ක කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි. තවද, එම පැකේජ සඳහා අවස්ථා 1 සිට 30 දක්වා කිහිප වාරයක් කාල දීර්ඝ කිරීම් ලබාදී ඇති බව නිරීක්ෂණය විය. | කොවිඩ් 19 වසංගත තත්ත්වය මත පනවා තිබුණු සංවරන සීමාවන් කොන්ත්‍රාත්කරුවන්ට වරින් වර කාල දීර්ඝ කිරීම් අනුමත කිරීමට සෘජුවම බලපා තිබුණි. | අමතර පිරිවැය වළක්වා ගැනීම සඳහා කාල රාමුව තුළ වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට උපරිම උත්සාහයක් ගත යුතුය. |
| (ආ) | දින 57 සිට දින 684 දක්වා කාල දීර්ඝ කිරීම් ලබා දී තිබුණු බව නිරීක්ෂණය වූ අතර එය ඌව, උතුරු සහ නැගෙනහිර පළාත්වල මුල් කොන්ත්‍රාත් කාලයෙන් (දින 730) සියයට 8 සිට සියයට 94 දක්වා ප්‍රතිශතයක් නියෝජනය විය. තවද, දින 912 ක් වූ මූලික කොන්ත්‍රාත් කාලය සියයට 6 සිට සියයට 18 දක්වා නියෝජනය කරමින් බස්නාහිර පළාතේ දින 58 සිට දින 164 දක්වා කාල දීර්ඝ කිරීම් ලබා දී තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය මත පනවා තිබුණු සංවාරන සීමාවන් කොන්ත්‍රාත්කරුවන්ට වරින් වර කාල දීර්ඝ කිරීම් අනුමත කිරීමට සෘජුවම බලපා තිබුණි. | අමතර පිරිවැය වළක්වා ගැනීම සඳහා කාල රාමුව තුළ වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට උපරිම උත්සාහයක් ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පෙර ලබාදී තිබුණු කාල දීර්ඝ කිරීම් සඳහා අනුමැතිය ලබා නොගෙන පවා වැඩසටහන විසින් නැවත නැවතත් කාල දීර්ඝ කිරීම් ලබාදී තිබුණි. | කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම සහ ඉංජිනේරු උපදේශකවරයාගේ නිර්දේශ මත නිශ්චිත හේතු සඳහා කාල දීර්ඝ කිරීම් ලබා දී ඇත. | අමතර පිරිවැය වළක්වා ගැනීම සඳහා කාල රාමුව තුළ වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට උපරිම උත්සාහයක් ගත යුතුය. |
| (ඈ) | විගණනයට ඉදිරිපත් කළ තොරතුරුවලට අනුව, කොන්ත්‍රාත් පැකේජවල කාල දීර්ඝ කිරීමේ දිනය අවසන් වූ දින සිට මාස 18 කට වැඩි කාලයක් ගතවී ඇතත්, තවදුරටත් දීර්ඝ කිරීමට කටයුතු කර නොතිබුණු අතර කොන්ත්‍රාත් පොදු කොන්දේසි 8.7 වගන්තියට පටහැනිව කොන්ත්‍රාත් පැකේජ 05 ක පමණක් රු. මිලියන 81.99 ක ප්‍රමාද ගාස්තු අය කර තිබුණි. | කොන්ත්‍රාත්කරුගේ උපදේශක නිර්දේශිත ඉල්ලීමේ වලංගුභාවය පරීක්ෂා කිරීමෙන් අනතුරුව අමාත්‍යාංශ මට්ටමේ තාක්ෂණික ඇගයීම් කමිටුවෙන් නිර්දේශයක් ලබාගනු ඇත. | කොන්ත්‍රාත් කොන්දේසි පිළිපැදිය යුතුය. |
| (ඉ) | කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාගේ අදහස් ලබාගැනීමට අසාමාන්‍ය කාල ප්‍රමාදයක් ගතවී ඇති බවත් එම කටයුතු කඩිනම් කිරීමට කටයුතු කර නොමැති බවත් අනාවරණය විය. | කාල දීර්ඝ කිරීම් අයදුම්පතක් අනුමැතිය ලබා ගැනීම සඳහා මට්ටම් කිහිපයක් හරහා යා යුතු අතර ඒ සඳහා සැලකියයුතු කාලයක් ගතවේ. | කාල දීර්ඝ කිරීම් ක්‍රියාවලිය කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |
| (ii) | අවලංගු කළ පැකේජ | | |
| (අ) | කොන්ත්‍රාත් පොදු කොන්දේසියේ 15.3 වගන්තිය අනුව අවලංගු කිරීමේ දැන්වීමක් නිකුත් කිරීමෙන් පසු ඉංජිනේරුවරයා විසින් කොන්ත්‍රාත්කරුවන්ට ලැබිය යුතු වැඩ, භාණ්ඩ සහ වෙනත් මූල්‍ය වටිනාකම් ප්‍රායෝගිකව හැකි ඉක්මනින් තීරණය කළ යුතු වුවද, ඉංජිනේරුවරයා විසින් මාස 09 සිට 14 දක්වා කාලයක් අවසන් වීමෙන් පසුව එය සකස් කර තිබුණි. තවද, කොන්ත්‍රාත් සාමාන්‍ය කොන්දේසියේ 15.3 වගන්තියට පටහැනිව අවලංගු කිරීමේදී වටිනාකම ගණනය කිරීමට පෙර එනම් 2021 මැයි 12 දින එම කොන්ත්‍රාත්තු සඳහා නැවත ලංසු කැඳවීමට වැඩසටහන කටයුතු කර තිබුණි. එබැවින් අවලංගු කරන ලද කොන්ත්‍රාත්කරුවන්ගේ නිම කරන ලද වැඩ සැලකිල්ලට නොගෙන ඉතිරි වැඩ සඳහා නැවත ලංසු කැඳවන ලද පැකේජවල සකස් කළ ඉංජිනේරු ඇස්තමේන්තුවල විශ්වසනීයත්වය විගණනයේදී ගැටලුකාරී තත්ත්වයක් විය. | තක්සේරු කිරීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පැවතියදී ප්‍රමාදයන් මත තවදුරටත් පිරිවැය වැඩිවීම අවම කිරීම සඳහා සහ මහජන පැමිණිලි සහ මහජන අපහසුතාවයන් මඟහරවා ගැනීම සඳහා ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම වෙනුවෙන් ලංසු කැඳවීමට ව්‍යාපෘතිය පියවර ගෙන ඇත. | කොන්ත්‍රාත් පොදු කොන්දේසි පිළිපැදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | කොන්ත්‍රාත් පොදු කොන්දේසි **15.3** වගන්තියට අනුව කොන්ත්‍රාත් අවලංගු කළ වහාම ඉංජිනේරුවරයා එම වැඩබිමේ ඇති ද්‍රව්‍ය තක්සේරු කර නොමැති බව නිරීක්ෂණය විය. | වැඩබිමේ ඇති ද්‍රව්‍ය තක්සේරු කිරීමට අදාල ඒකාබද්ධව පරීක්ෂණ ලිපි ලේඛන කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර නැත. | කොන්ත්‍රාත් පොදු කොන්දේසි පිළිපැදිය යුතුය. |
| **(ඇ)** | අවලංගු කළ පැකේජ තුන වෙනුවට, එය කොන්ත්‍රාත් පැකේජ **09** කට බෙදා **2021** වර්ෂයේදී වැඩසටහන විසින් නැවත ලංසු තබා තිබුණි. ඒ අතරින් තෝරාගත් කොන්ත්‍රාත්කරුවන්ට **2022** දෙසැම්බර් **31** දිනට ලබාදී තිබුණේ කොන්ත්‍රාත් පැකේජ **07**ක් පමණි. අවලංගු කරන ලද පැකේජවල මූලික කොන්ත්‍රාත් මිල ගණන් සහ අවලංගු කරන තෙක් කරන ලද වැඩවල වටිනාකම සමඟ සසඳන විට නැවත ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තුවල වටිනාකම රු. මිලියන **1,040.64** කින් වැඩි වී තිබුණි. තවද, ඉදිරියේදී ඉතිරි පැකේජ දෙක ප්‍රදානය කිරීමේදී පිරිවැය තවදුරටත් ඉහළ යා හැකි බව නිරීක්ෂණය විය. | අවලංගු කළ කොන්ත්‍රාත්තුවලට සාපේක්ෂව කොන්ත්‍රාත් මිල පැහැදිලිව ඉහළ මට්ටමක පැවතුනි.<br>නැවත ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්වල වටිනාකම රු. මිලියන **1,040** කින් වැඩිවී තිබුණද, සේවා යෝජකයාගේ හිමිකම් පෑම සහ කාර්ය සාධන බැඳුම්කර මුදල් කරගැනීම මත මෙම පිරිවැය අඩු වනු ඇත. | අමතර පිරිවැය වළක්වා ගැනීම සඳහා කාල රාමුව තුළ වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට උපරිම උත්සාහයක් ගත යුතුය. |
| **(ඈ)** | මාර්ග ඉදිකිරීමේ මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් **2020** දෙසැම්බර් **10** දින බීඒ-**06** කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට ඉංජිනේරුවරයා නිර්දේශ කර තිබුණද, වැඩසටහන විසින් **2021** ජනවාරි **05** දින රු. මිලියන **90.47** ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරමේ දෙවන කොටස නිදහස් කර තිබුණි. පසුව, **2021** පෙබරවාරි **28** දින දක්වා අත්තිකාරම් ඇපකර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අවලංගු කිරීමේ නිර්දේශ ක්‍රියාවට නංවන තුරු එය ප්‍රතික්ෂේප කිරීමට හෝ රඳවා ගැනීමට නොහැකි විය. | කොන්ත්‍රාත්කරුවන්ට වැඩිපුර ගෙවීම් වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ඉ)** | අවලංගු කරන ලද කොන්ත්‍රාත්තුවලට අදාළව වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ආපසු අයකර ගැනීමට සහ ණය නියෝජිතායතනයට ආපසු ගෙවීමට ණය දෙන ආයතනය උපදෙස් දී තිබුණද, වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් බැඳුම්කර මුදල් කිරීමට එරෙහිව කොන්ත්‍රාත්කරුවන් විසින් උසාවියේ නඩුවක් ගොනු කර තිබූ නිසා වැඩසටහනට වසරකට අධික කාලයක් රු. මිලියන **560.14** ක මුදලක් අයකර ගැනීමට නොහැකිව තිබුණි. | ඇප මුදල් අය කිරීම වැලැක්වීම සම්බන්ධයෙන් අපට විරුද්ධව වාණිජ මහාධිකරණයේ නඩුවක් පවරා ඇත. | කොන්ත්‍රාත්තුව අවලංගු කළ වහාම ඇපකර මුදල් කරගැනීමට පියවර ගත යුතුය. |
| **(iii)** | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ **2.4** සහ **2.6** උප වගන්තිවලට අනුව ඉංජිනේරු ඇස්තමේන්තුව, ලංසු ලේඛන සහ ප්‍රමාණ පත්‍ර ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිසි ලෙස ඇගයීමට ලක් කළ යුතු වුවද, ඉංජිනේරු ඇස්තමේන්තු, ලංසු ලේඛන සහ ප්‍රමාණ පත්‍රවල, රේටයන්ගේ විෂමතා සහ අයිතම වැරදි ලෙස අර්ථකථනය කිරීම හේතුවෙන් බීඒ **4** සහ බීඒ **5** | අනාගත කොන්ත්‍රාත් වලදී, කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමෙන් පසු ප්‍රමාණ පත්‍රවල එවැනි අයිතම භාවිතා නොකිරීමට කටයුතු කරනු ලැබේ. එසේම, ඔවුන්ගේ ලංසු ඇගයීමේ මාර්ගෝපදේශ වෙනස් කරන ලෙස ආ.සං.බැ. වෙත ඉල්ලීමක් | පාඩුව අයකර ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කොන්ත්‍රාත් පැකේජවලින් 2022 දෙසැම්බර් 31 දිනට වැඩසටහනට රු. මිලියන 48.2 ක පාඩුවක් සිදුවී තිබුණි. | කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (iv) | කොන්ත්‍රාත් කොන්දේසිවල උප වගන්ති 108.4 සහ 120.7 අනුව වැඩසටහන අවසානයේ සියලුම රසායනාගාර, ගෘහ භාණ්ඩ සහ මිනින්දෝරු උපකරණ කොන්ත්‍රාත්කරු වෙත ආපසු ලබා දෙනු ලැබුවද, රසායනාගාර, ගෘහ භාණ්ඩ සහ මිනින්දෝරු උපකරණ සඳහා පිළිවෙලින් රු. මිලියන 518.99 ක් සහ රු. මිලියන 14.13 ක් එකවර ගෙවීමක් ලෙස 2022 දෙසැම්බර් 31 දිනට ගෙවා තිබුණි. මේ අනුව කොන්ත්‍රාත්කරුවන්ට හිතකර කොන්ත්‍රාත් කොන්දේසි අනවශ්‍ය ප්‍රතිලාභ ලබා දීමට හේතු වනු ඇති බවට නිරීක්ෂණය විය. | ව්‍යා.අ.ඒ. විසින් මෙම කොන්දේසි කෙටුම්පත් කරනු ලද්දේ මා.සං.අ. සතුව ප්‍රමාණවත් තරම් එම උපකරණ තොගයක් ඇති බැවිනි. | කොන්ත්‍රාත් කොන්දේසි අනුගමනය කිරීමට උපදෙස් දිය යුතුය. |
| (v) | වැඩසටහන විසින් මුදල් කරගැනීම සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග ප්‍රමාද වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවලංගු කරන ලද කොන්ත්‍රාත් පැකේජ 03 කට අදාළ රු. මිලියන 690.74 ක කාර්ය සාධන ඇපකර මුදල් කරගැනීමට වැඩසටහන අපොහොසත් වී තිබුණි. | කොන්ත්‍රාත්කරුවන් විසින් කාර්ය සාධන ඇපකර මුදල් අයකර ගැනීම වැළැක්වීම සඳහා අධිකරණ නියෝග ලබාගෙන තිබුණු අතර නඩු විභාග වෙමින් පවතී. | කොන්ත්‍රාත් අවලංගු කළ වහාම ඇපකර මුදල් බවට පත්කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (vi) | 2022 දෙසැම්බර් 31 දිනට අයකර නොගත් සමුච්චිත වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් රු. මිලියන 9,984.24 ක් වූ අතර ණය මුදලේ ඉතිරි කොටස් නිකුත් කරන තෙක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් අයකර ගැනීමේ හැකියාව අවිනිශ්චිත විය හැක. | අතුරු ගෙවීම් සඳහා ගෙවීම් ආරම්භ කළ විගස වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ආපසු අයකර ගැනීමට හැකිවනු ඇත. | වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ආපසු අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (vii) | ඌව පළාතේ අවලංගුකරන ලද කොන්ත්‍රාත් නැවත ලංසු කැඳවීමේ ක්‍රියාවලියේ ප්‍රමාදය මාර්ග පුනරුත්ථාපන කටයුතු සුමටව ක්‍රියාත්මක කිරීමට සෘජුවම බලපා තිබුණි. දැනට පවතින මාර්ග නඩත්තු කිරීම සඳහා මාර්ග පුනරුත්ථාපන කටයුතු කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසිය 103.2(2) යටතේ ගෙවීම් අයිතමයක් ඇතත්, නැවත ලංසු කැඳවන ලද කොන්ත්‍රාත් ප්‍රදානය කරන තෙක් හදිසි නඩත්තු කටයුතු ආවරණය කිරීම සඳහා රු. මිලියන 66.26 කට අමතර කොන්ත්‍රාත් 04 ක් ප්‍රදානය කර තිබුණි. වැඩසටහනේ පිරිවැය වැඩිවීමට එය සෘජුවම බලපා තිබුණි. | නැවත ලංසු කැඳවූ කොන්ත්‍රාත් ප්‍රදානය කරන තෙක් හදිසි නඩත්තු කටයුතු ආවරණය කිරීම සඳහා මෙම පිරිවැය දැරීම වැළැක්විය නොහැක. | අමතර පිරිවැය වළක්වා ගැනීම සඳහා නියමිත කාලය තුළ වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට උපරිම උත්සාහයක් ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (viii) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 වගන්තියට අනුව, කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 500 ට වැඩි කොන්ත්‍රාත් ගිවිසුම් රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අත්සන් කළ යුතුය. කෙසේ වෙතත් එම සීමාව ඉක්මවා වැඩසටහනේ සිවිල් වැඩ කොන්ත්‍රාත්තු 66 ක් සහ උපදේශන කොන්ත්‍රාත්තු 4 ක් මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා විසින් අත්සන් කර තිබුණි. | 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරි පනතට අනුව, මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ එළඹෙන සියලුම කොන්ත්‍රාත් අත්සන් කිරීමට මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයාට බලය පවරා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුගත වියයුතුය. |

3.3 උපදේශන සේවා

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| | ප්‍රධාන වශයෙන් මාර්ග නඩත්තු භාර අරමුදල (RMTF) පුළුල් කිරීම, ප්‍රාදේශීය මාර්ග නඩත්තු කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ වගකීම පුළුල් කිරීම සහ වැඩසටහන සඳහා විස්තීර්ණ ගිණුම්කරණ සහ මූල්‍ය අත්පොතක් සකස් කිරීම සඳහා වැඩසටහන විසින් 2022 ජනවාරි 03 දින රාජ්‍ය පරිපාලන විශේෂඥයකු සමඟ රු. මිලියන 8.2 ක වටිනාකමකින් යුත් ගිවිසුමක් අත්සන් කර තිබුණි. පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ. | | |
| (i) | ප්‍රාදේශීය මාර්ග නඩත්තුව ආවරණය වන පරිදි මාර්ග නඩත්තු භාර අරමුදල ප්‍රතිසංවිධානය කර පුළුල් කිරීමට සැලසුම් කර තිබුණද, විශේෂඥයා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවේ ඇතුලත් විකල්ප ප්‍රතිපත්ති සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් අනාවරණය කර නොතිබුණි. | සමහර ප්‍රතිපත්ති මට්ටමේ තීරණ තවමත් සකසා නොමැත. එබැවින් මාර්ග නඩත්තු භාර අරමුදල ප්‍රතිසංවිධානය සාර්ථක වී නැත. | කොන්ත්‍රාත් කාලය තුළ උපදේශකවරයාගේ කාර්යය ඇගයීමට කටයුතු කළ යුතුය. |

3.4 මාර්ග පුනරුත්ථාපන ප්‍රසම්පාදනයන්

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| | බස්නාහිර පළාතේ ජාතික මාර්ග 06 ක කි.මී. 54.52 ක් පුනරුත්ථාපනයය කිරීම මෙම වැඩසටහන මගින් ක්‍රියාත්මක කර තිබුණි. ප්‍රසම්පාදන සැලැස්මට අනුව, ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2021 සැප්තැම්බර් 15 දිනට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. ඉහත පැකේජ 06 සඳහා ඇස්තමේන්තුගත මුදල රු. මිලියන 7,810 කි. පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ. | | |
| (i) | තාක්ෂණික ඇගයීම් කමිටුව 2021 නොවැම්බර් 19 දින පැවති රැස්වීමේදී පැකේජ-2 සඳහා කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද ලංසු මිල සාකච්ඡා කිරීමට නිර්දේශ කර තිබුණද, අදාළ කොන්ත්‍රාත්කරුට මිල සාකච්ඡා කිරීමකින් තොරව කොන්ත්‍රාත්තුව ප්‍රදානය | අධික වාහන තදබදය හේතුවෙන් මෙම මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සංකීර්ණ බව අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ අදහස වී තිබුණි. | ප්‍රසම්පාදන කමිටුව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් කරන ලද නිර්දේශ අනුගමනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කිරීමට අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. තවද තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශවලට අනුකූල නොවී අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් කොන්ත්‍රාත්කරුවන්ට ලබා දෙන අනිසි ප්‍රතිලාභ ව්‍යාපෘති පිරිවැය අනාර්ථික ලෙස ඉහල යාමට සෘජුවම බලපා තිබුණු බව නිරීක්ෂණය විය. | | |
| (ii) | ප්‍රසම්පාදන අත්පොතේ 7.9.2 වගන්තියට අනුව, ඇගයීමට ලක්කළ අවම ප්‍රතිචාරාත්මක ලංසුව ඉංජිනේරු ඇස්තමේන්තු සැලකිය යුතු ආන්තිකයකින් ඉක්මවන්නේ නම්, සැහීමකට පත්විය හැකි කොන්ත්‍රාත් මිලක් ලබා ගැනීම සඳහා නව ලංසු කැඳවීමට හෝ ලංසුකරු සමඟ සාකච්ඡා කිරීමට ප්‍රසම්පාදන ආස්ථිතිත්වය පියවර ගත යුතුය. පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (අ) | එකඟවූ ලංසු මිල ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සැලකිය යුතු ලෙස වැඩි වුවද බස්නාහිර පළාතේ ජාතික මාර්ග කොන්ත්‍රාත් තුනක් කොන්ත්‍රාත්කරුවන්ට ලබාදී තිබුණි. | එකඟ වේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ කොන්දේසි අනුගමනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වවුනියාව දිස්ත්‍රික්කයේ ග්‍රාමීය මාර්ග කොන්ත්‍රාත් පැකේජ හතරක් (වීඒ-01 සිට 04 දක්වා) එකගතාවයෙන් පසුව පවා සියයට 33 සිට සියයට 39 දක්වා සැලකිය යුතු වෙනස්කම් සහිතව ප්‍රදානය කර තිබුණි. | ලංසු මිල ගණන් සාධාරණ බව සහ කොන්ත්‍රාත්තුව ප්‍රධානය කිරීම තාක්ෂණික ඇගයීම් කමිටුවේ අදහස විය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ කොන්දේසි එළෙසම අනුගමනය කළ යුතුය. |
| (iii) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සම්මත ලංසු ලේඛනවලට පටහැනිව අවම ප්‍රතිචාරාත්මක ලංසුකරුට කොන්ත්‍රාත් එකකට වඩා වැඩි ප්‍රමාණයක් ලබාදීමට නොහැකි වන පරිදි වැඩසටහන විසින් ලංසු ලේඛනවල 3 වැනි කොටසේ 1.6 වගන්තිය යටතේ විශේෂ කොන්දේසියක් ඇතුළත් කර තිබුණි. එබැවින් අවම ප්‍රතිචාරාත්මක ලංසුකරුට කොන්ත්‍රාත් පැකේජ එකකට වඩා ප්‍රදානය කිරීමට නොහැකි වී තිබුණි. මෙම ක්‍රමය යටතේ ප්‍රදානය කර තිබුණු පැකේජ පහෙන් 2022 දෙසැම්බර් 31 වන විට අතිරේකව දැරීමට සිදුව තිබුණු මුදල රු. මිලියන 695.45 ක් විය. | එකඟ වේ. කොන්ත්‍රාත්කරුවෙකුට කොන්ත්‍රාත් කිහිපයක් ප්‍රදානය කිරීම හේතුවෙන් ක්‍රියාත්මක කිරීමේ අදියරේදී අසාර්ථක වීම වැළැක්වීම සඳහා මෙම නිර්ණායකය හඳුන්වා දෙන ලදී. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ කොන්දේසි එළෙසම අනුගමනය කළ යුතුය. |
| (iv) | ප්‍රසම්පාදන සැලැස්මට අනුව සියලුම පැකේජ 2021 සැප්තැම්බර් 21 දිනට පෙර ප්‍රදානය කිරීමට සැලසුම් කර තිබුණද, රු. මිලියන 4,320.25 ක් වූ එන්ආර්/1 සහ එන්ආර්/3 ලෙස නම් කර ඇති පැකේජ දෙකක් 2022 දෙසැම්බර් 31 වන විටත් කොන්ත්‍රාත්කරුවන්ට ප්‍රදානය කර නොතිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට | එකඟ වේ. වැඩසටහන යටතේ අරමුදල් නොමැතිකම හේතුවෙන් ප්‍රදානය කිරීමේ තීරණය අත්හිටුවා ඇත. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රමාද කාලය මාස 15 කට අධික වූ අතර ඉදිරියේදී එම පැකේජ දෙකෙහි ලංසු වල වලංගුභාවය විගණනයේදී සැක සහිත බව නිරීක්ෂණය විය. | | |
| (v) | වැඩසටහනේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව රු. මිලියන 7,163 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිත ප්‍රසම්පාදන 21 ක් 2022 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට සැලසුම් කර තිබුණද, ණය මුදලේ 4 වන කොටස අත්සන් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් එම ප්‍රසම්පාදන අවසන් කර නොතිබූ බව නිරීක්ෂණය විය. | එකඟ වේ. අරමුදල් ගැටළු හේතුවෙන් ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද විය. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.5 ක්ෂේත්‍ර පරීක්ෂණ වලදී අනාවරණය වූ කරුණු**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| | වවුනියාව දිස්ත්‍රික් මාර්ග ඉදිකිරීම් සම්බන්ධයෙන් සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී පහත නිරීක්ෂණ සිදු කරන ලදී. | | |
| (අ) | කොන්ත්‍රාත් කාලය දැනටමත් දින 72 සිට දින 359 දක්වා දීර්ඝ කර ඇති කි.මී. 19.66 කින් සමන්විත වීජ් 01 සහ වීජ් 04 කොන්ත්‍රාත් පැකේජවල මාර්ග 13 ක 2022 දෙසැම්බර් 31 දින වනවිට පුණරුත්ථාපන කටයුතු ආරම්භ කරද නොතිබුණි. | රාජ්‍ය වියදම් පාලනයට අදාළ ජාතික අයවැය චක්‍රලේඛය ඉදිකිරීම් කටයුතු නැවැත්වීමට බලපා ඇත. | අමතර පිරිවැය වළක්වා ගැනීම සඳහා නියමිත කාලය තුළ වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට උපරිම උත්සාහයක් ගත යුතුය. |
| (ආ) | තාක්ෂණික පිරිවිතරවල 103 උප වගන්තියට අනුව කොන්ත්‍රාත්කරුවන් විසින් රථවාහනවල හා තෙවන පාර්ශ්වයේ ආරක්ෂාව සඳහා සියලුම සංඥා, ලාම්පු, බාධක, රථවාහන පාලන සංඥා, මාර්ග සලකුණු ආදිය සපයා සවි කිරීමටත් රාත්‍රි කාලයේ මාර්ග බාධකවල දීප්තිමත් රතු පහන් හෝ අනතුරු ඇඟවීමේ ලාම්පු සවිකිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වුවද, වීජ් 03 සහ වීජ් 04 පැකේජවල කොන්ත්‍රාත්කරුවන් එම අවශ්‍යතාවලට අනුකූල වීමට අපොහොසත් වී තිබුණි. තවද, එම කොන්ත්‍රාත්කරුවන්ට රු. මිලියන 18.05 ක මුදලක් ගෙවා ඇති බවද නිරීක්ෂණය විය. | ක්ෂේත්‍රයේ පැවති අඩුපාඩු සැලකිල්ලට ගෙන නිකුත් කරන ලද ලිපි සහ අවශ්‍යතා වලට අනුකූල වන ලෙස කොන්ත්‍රාත්කරුට නැවත නැවතත් උපදෙස් දෙන ලදී. | සේවායෝජක සහ උපදේශක විසින් ආරක්ෂිත පියවරයන් පිළිබඳව ඵලදායී ලෙස සමාලෝචනය කළ යුතුය. |
| (ඇ) | පිරිවිතරවල 701 උප වගන්තිය අනුව මාර්ග දෙපස පිහිටි පරිශ්‍ර හිමිකරුවන්ට සහ මාර්ග භාවිත කරන්නන්ට දැඩි අපහසුතාවයක් ඇති නොවන පරිදි පරිශ්‍රවලට අදාල ප්‍රවේශයන් හැකිතාක් අඩු කාලයක් තුළ ඉදිකිරීමට කටයුතු කළ යුතු වුවද, පිළිවෙළින් වීජ් 03, වීජ් 02 සහ වීජ් 04 පැකේජවල එන්ජ්වී 026, එන්ජ්වී 066 සහ එන්ජ්වී 046 දරන මාර්ග අංකවල නිවාස සඳහා ප්‍රවේශ මාර්ග සකස් කර නොතිබුණි. | පරිශ්‍රයේ හිමිකරුවන්ට සහ මාර්ග භාවිතා කරන්නන්ට දැඩි අපහසුතාවයක් ඇති නොවන පරිදි කොන්ත්‍රාත්කරුවන් විසින් අවම කාලයක් තුළ තාවකාලික පදනමක් මත ප්‍රවේශ | අවම කාලයක් තුළ මාර්ග ප්‍රවේශ ඉදිකර දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සකස්කරදී ඇත. | |
| (ඈ) | එන්වීජ් 026 සහ එන්වීජ් 062 මාර්ගවල තාර දැමීම පිළිවෙළින් 2021 දෙසැම්බර් 21 සහ 2021 සැප්තැම්බර් 28 දිනවලදී අවසන් කරන බව දන්වා තිබුණද, වැඩ අවසන් නොකළ මාර්ග උරහිස්, ව්‍යුහයන්, මාර්ග සලකුණු සහ නාම පුවරු ආදිය නිරීක්ෂණය වූ අතර උරහිස් නිම කිරීමේ ප්‍රමාදය තාර තට්ටුවේ දාර ඛාදනය වීමට සහ මාර්ගවල ගුණාත්මකභාවය හා කල්පැවැත්ම පිරිහීමට හේතු විය හැකි බව තවදුරටත් නිරීක්ෂණය විය. | දේශීය වෙළෙඳපොළේ ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟය සහ අයහපත් මුදල් ප්‍රවාහ තත්ත්වය හඳුනාගත් ඉතිරි වැඩ නිම කිරීමට සැලකිය යුතු ලෙස බලපෑවේය. | පිරිවිතරයන් අනුගමනය කිරීමට උපදෙස් දිය යුතුය. |

**3.6** පරිබාහිර ගෙවීම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට ණය මුදලින් භාවිතයට නොගත් අරමුදල් මත ණය දෙන ආයතනයට වැඩසටහන විසින් එ.ජ.ඩො. මිලියන 0.46 කට සමාන රු. මිලියන 90.50 ක සමුච්චිත කැපකරු ගාස්තුවක් ගෙවා තිබුණි. | ණය මුදලේ අදියරයන් සැලසුම් කළ කාලසීමාව තුළ භාවිතා කිරීමෙන් කැපකරු ගාස්තුව අවම කිරීමට අපේක්ෂා කෙරේ. | ණය මුදල් කාර්යක්ෂමව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

**3.7** මානව සම්පත් කළමණාකරණය සම්බන්ධ ගැටළු

| තනතුර | තනතුරු සංඛ්‍යාව | | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| | අනුමත | 2022 දෙසැම්බර් 31 දිනට තත්‍ය | පුරප්පාඩු සංඛ්‍යාව | | |
| ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සම්බන්ධීකරණ | 6 | 2 | 4 | සේවා අවශ්‍යතාවයට අනුව අත්‍යාවශ්‍ය කාර්ය මණ්ඩලය පමණක් බඳවා ගැනීමට පත්වීම් බලධාරියා අනුමැතිය ලබාදී තිබුණි. | කාර්ය සාධනය උපරිම කිරීම සඳහා ප්‍රශස්ත සේවක සංඛ්‍යාවක් වැඩසටහන විසින් බඳවා ගත යුතුය. |
| ඉංජිනේරු ව්‍යාපෘති ඉංජිනේරු | 14 | 3 | 11 | | |
| | 28 | 17 | 11 | | |

**3.8** වියාපෘති අධීක්ෂණ ඒකකයට අදාල ගැටළු

| ප්‍රධාන සේවක තනතුරු | ව්‍යා.ක.ඒ. සේවා කාලය | වෙනත් ආයතනවල රැකියාවක නියුක්තිකයෙක්ද | සේවයේ නියුතු පදනම කොන්ත්‍රාත් /වැඩ බැලීම් | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඌව) | මාස 25 | ඔව් (මාර්ග සංවර්ධන අධිකාරිය) | වැඩ බැලීමේ පදනම | එම තනතුරට බඳවා ගැනීම සඳහා කිහිප වතාවක්ම අයදුම්පත් කැඳවා ඇතත් මූලික සුදුසුකම් සපුරා ඇති වෙනත් අයදුම්කරුවන් නොමැත. | චක්‍රලේඛ උපදෙස් අනුව ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා සැම විටම පූර්ණ කාලීන පදනමින් බඳවා ගත යුතුය. |

**3.9** පද්ධති හා පාලන

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| වැඩසටහනේ පහසුකම් පරිපාලන අත්පොත සහ 2019 මාර්තු 05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 හි 9 වැනි වගන්තියට අනුව, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය මෙහෙයවීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම වශයෙන් කාර්තුමය වශයෙන් පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේ 2 වන සහ 4 වන කාර්තුවල රැස්වීම් පවත්වා නොමැති බව නිරීක්ෂණය විය. | 2022 වර්ෂය තුළ ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් දෙකක් පවත්වා ඇත. | මෙහෙයුම් කමිටු නියමිත ආකාරයට ක්‍රියාත්මක කළ යුතුය. |